# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,611 - 2009 ජූලි මස 17 වැනි සිකුරාදා - 2009.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 986 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 936 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 986 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 990 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ජූලි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ජූලි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2009**

වසර දෙකක කාලයක් සඳහා වැලිගෙපොළ 1, වැලිගෙපොළ 2 සහ කලවාන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීමට මිල ගණන් 2009.07.30 දින පස්වරු 2.00 දක්වා සබරගමුව පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලවලදී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ඒ සඳහා වන විස්තර සහ ඉල්ලුම් පත්‍ර කාර්යාලයීය වේලාවන් තුළ අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ආපසු නොගෙවන රු. 250 ක මුදලක් ගෙවා 2009.07.29 දින පස්වරු 12.00 වන තෙක් ලබාගත හැක.

කවරයේ ඉහළ වම් කෙළවර 'ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (ස්ථාන නාමය)' යනුවෙන් සඳහන් කරන ලද ඔබගේ මුද්‍රා තබන ලද මිල ගණන් සපුරාලිය යුතු අවශ්‍යතා විස්තර ද සහිතව 2009.07.30 දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම කළ හැක.

සර්වේයර් ජනරාල්.

සර්වේයර් ජනරාල් කාර්යාලය,
කිරුළ පාර, කොළඹ 05.

07-541

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

මොරටුව, එගොඩ උයන දකුණ, අංක 210 දරන ස්ථානයේ පදිංචි වෙදගේ මාලනී ලංකාවතී ජයකුලසූරිය වන මා විසින් එම ලිපිනයේ ම පදිංචි, කාරියවසම් වන්නකු තන්ත්‍රිගේ සාරංගිකා අමරරංසි ජයකුලසූරිය යන අයට බලය පවරමින් ප්‍රසිද්ධ නොතාරිස් ඕවන් ද මෙල් මහතා විසින් 2004.03.05 වැනි දින ලියා සහතික කරන ලද අංක 1329 දරන ඇටෝර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

07-482

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම.

සමාගමේ නම : එඩ්/පික්/ඉන්ස්ටිටියු ඵෆ් එක්ස්ටෙන්ඩඩ් ස්ටඩීස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී. 67834
සංස්ථාපනය කළ දිනය : 2009.05.18
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 30 හිල්ඩන් පෙදෙස, කොළඹ 04.

සමාගමේ ලේකම්,
ජේ ඇන්ඩ් ඒ මැනේජ්මන්ට් සිස්ටම්ස් පෞද්ගලික සමාගම.

අංක 96 2/7, කන්සිස්ටරි බිල්ඩිම, මල්වත්ත පාර, කොළඹ 11.
දුරකථන අංක 011-4614887/011-4737315

07-435

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : අම්බිකා කන්ස්ට්‍රක්ෂන් කම්පැනි (පෞද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 67898
සංස්ථාපනය කළ දිනය : 2009.05.28
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 15, කදිරකාමතම්බි වීදිය, සෙල්වනායගපුරම්, ත්‍රිකුණාමලය.

සමාගමේ ලේකම්,
ජේ ඇන්ඩ් ඒ මැනේජ්මන්ට් සිස්ටම්ස් පෞද්ගලික සමාගම.

අංක 96-2/7, කන්සිස්ටරි බිල්ඩිම, මල්වත්ත පාර, කොළඹ 11.
දුරකථන අංක 011-4614887- 011-4737315.

07-436

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : සාරා ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 68076
සංස්ථාපනය කළ දිනය : 2009.06.10
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 131, ගාලු පාර, දෙහිවල

සමාගමේ ලේකම්,
ජේ ඇන්ඩ් ඒ මැනේජ්මන්ට් සිස්ටම්ස් පෞද්ගලික සමාගම.

අංක 96-2/7, කන්සිස්ටරි බිල්ඩිම, මල්වත්ත පාර, කොළඹ 11.
දුරකථන අංක 011-4614887- 011-4737315.

07-437

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 සමාගම් ආඥා පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2009 ජනාවරි 29 වැනි දින සංස්ථාපිත කර ඇත.

සමාගමේ නම : සවුත් ඒෂියන් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට් ලිමිටඩ්)
ලියාපදිංචි අංකය : පී. වි. 66898
ලියාපදිංචි ලිපිනය : අංක 705 2/1, හයිලෙවල් පාර, ගංගොඩවිල, නුගේගොඩ.

07-567

---

## සමාගම ලියාපදිංචි කිරීමේ සාමාන්‍ය දැන්වීම

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 වැනි ජේදයේ අනුජේද 01 ට අනුව පහත සඳහන් සමාගම නීත්‍යානුකූලව සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගම නාමය : ඔන්ලයින් සොලුෂන්ස් පෞද්ගලික සමාගම
සාමගම අංකය /දිනය : පීවී 68196, 2009 ජූලි 23
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 78, සී පී ද සිල්වා මාවත, කල්දෙමුල්ල, මොරටුව.

අධ්‍යක්ෂක මණ්ඩලයේ නියෝගය පරිදි
සමාගම් ලේකම්වරු,

මැන්සෙක් සර්විසස් පෞද්ගලික සමාගම,
පීටී 6, අංක 6A, 6C, ඩේසි විලා මාවත,
බම්බලපිටිය, කොළඹ 04.
දුරකථන අංක 2597911/2597910.

07-559

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

ඇමෙරිකා එක්සත් ජනපදයේ කැලිපෝර්නියාවේ නෝත්රිජ් අංක 128, 9018 බල්බෝ බිලව්ඩ් හි පදිංචි ජී. ඒ. ඉන්දික ජයරත්න වන මම, මා විසින් වර්ෂ 2003.06.21 දින දාතමින් කැලිපෝර්නියාවේ, ප්‍රසිද්ධ නොතාරිස් හල කේ අනානි මහතා විසින් සහතික කරන ලද හා බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ඇටර්නි බලපත්‍ර පොතේ 7 වැනි කාණ්ඩයේ 94 වැනි පත්තිරුවේ 3974 දිනපොත් අංකය යටතේ ලියාපදිංචි කර ඇති ඇටර්නි බලපත්‍රය මත මහරගම, පමුණුගම පාරේ, අංක 123/1 දරන ස්ථානයේ පදිංචි ජී ආරච්චිගේ ජයරත්න යන අයට ලබාදී තිබූ ඇටර්නි බලය මෙයින් අවලංගු හා බල රහිත කරනු ලැබේ.

07-522

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 11 වගන්තිය යටතේ වූ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 29 වැනි වගන්තිය යටතේ එස් පව(ර්) ජෙනරේෂන් මාතර ලිමිටඩ්, ලියාපදිංචි අංක පී කිවු 98, වර්ෂ 2009 ජුනි 01 දින සිට පෞද්ගලික සමාගමක් වන අතර එහි නාමය එස් පව(ර්) ජෙනරේෂන් මාතර (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් වෙනස් වන බවට සලකන මෙන් මෙයින් දන්වා සිටිනු ලැබේ.

ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය : ලෙවල් 8, එයිට්කන් ස්පෙන්ස් ටවර් 2, අංක 315, වොක්ෂෝල් වීදිය, කොළඹ 2.

එයිට්කින් ස්පෙන්ස් කෝපරේට් ෆයිනෑන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

07-538

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත බිබිලේගම බටහිර ගම නැගුම ජනතා සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3652
3. සංස්ථාගත කළ දිනය : 2009 මාර්තු 09
4. ලියාපදිංචි ලිපිනය : බිබිලේගම, පස්සර.

සමාගමේ ලේකම්.

2009 ජුනි 10 වැනි දිනදීය.

07-351

## ඇටොර්නි බලපත්‍රය අවලංගු කිරීම

දෙහිවල ගල්වල පාරේ අංක 214/5 හි පදිංචි හල්නෙත්ති චතුර මනෝ සිල්වා වන ම විසින් 1988.07.28 දින ප්‍රසිද්ධ නොතාරිස් ජී. ආර්. රාජපක්ෂ සහතික කළ අංක 02 ඇටෝර්නි බලපත්‍රයෙන් එච්. සී. බෙන්ජමින් සිල්වාට ප්‍රදානය කළ ඇටෝර්නි බලය 2009.06.03 දින සිට අවලංගු කළ බව ප්‍රකාශ කරමි.

07-418

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත අඩාවත්ත ගමනැගුම ජනතා සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3653
3. සංස්ථාගත කළ දිනය : 2009 මාර්තු 11 වැනි දින
4. ලියාපදිංචි ලිපිනය : අඩාවත්ත, ලුණුගල.

සමාගමේ ලේකම්.

2009 ජුනි 14 වැනි දින දී ය.

07- 356

---

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත අමුණුදෝව ගමනැගුම ජනතා සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3683
3. සංස්ථාගත කළ දිනය : 2009 අප්‍රේල් 22 වැනි දින
4. ලියාපදිංචි ලිපිනය : අමුණුදෝව, මඩොල්සීම

සමාගමේ ලේකම්.

2009 ජුනි 14 වැනි දින දී ය.

07-354

---

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත හොප්ටන් ගමනැගුම ජනතා සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3682
3. සංස්ථාගත කළ දිනය : 2009 අප්‍රේල් 22 වැනි දින
4. ලියාපදිංචි ලිපිනය : හොප්ටන්

සමාගමේ ලේකම්.

2009 ජුනි 14 වැනි දින දී ය.

07-355

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත බිබිලේගම නැගෙනහිර ගම නැගුම ජනතා සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3649
3. සංස්ථාගත කළ දිනය : 2009 මාර්තු 09 වැනි දින
4. ලියාපදිංචි ලිපිනය : බිබිලේගම, පස්සර.

සමාගමේ ලේකම්.

2009 ජුනි 10 වැනි දින දී ය.

07-352

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත ඌවකැලේ ගමනැගුම ජනතා සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3684
3. සංස්ථාගත කළ දිනය : 2009 අප්‍රේල් 22 වැනි දින
4. ලියාපදිංචි ලිපිනය : ඌවකැලේ, මඩොල්සීම

සමාගමේ ලේකම්.

2009 ජුනි 14 වැනි දින දී ය.

07-353

---

## මහජනතාව වෙත කෙරෙන නිවේදනය

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ වූ විධිවිධාන අනුව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : ඒෂියා ස්පෝර්ට්ස් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 68060
ලියාපදිංචි ලිපිනය : අංක 65, සිරිපා පාර, කොළඹ 05
සමාගම් ලේකම් : නීතිඥ සමන් සේනාධීර

07-358

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලුණුවිල ජය මාවතේ පදිංචි වර්ණකුලසූරිය ප්‍රියංකා රූත් තිසේරා වන මම, අංක 13387 සහ වර්ෂ 2008 ජුනි මස 12 වැනි දින පී. එන්. ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කළ විශේෂ ඇටෝර්නි බලපත්‍රය පිට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් මූණමල්දෙනිය, කඹුරාපොල පදිංචි හේරත් මුදියන්සේලාගේ උපාලි හේරත් යන අය පත් කිරීම 2009.05.17 වැනි දින සිට අවලංගු කරන බවත්, මින් ඉදිරියට මෙම විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් කරනු ලබන කිසිදු කටයුත්තක් සම්බන්ධව මාගේ වගකීමක් නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

වර්ණකුලසූරිය ප්‍රියංකා රූත් තිසේරා.

07-359

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2009.06.09 දින සිට ලියාපදිංචි කර ඇත.

සමාගමේ නාමය : ජී. එනර්ජි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV68054
ලියාපදිංචි ලිපිනය : ජී. එනර්ජි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02.

බිස්නස්මේට් ප්‍රයිවෙට් ලිමිටඩ්,
අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.

07-376

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 08, බොරැල්ල, ලක්ෂ්මී උයන, අංක 10 (වර්තමාන අංක 234/7, රණාල පාර, හබරකඩ, හෝමාගම) හි පදිංචි පුලුත්කුට්ටි ආරච්චිගේ දොන් ජයනාත් මයිකල් බස්නායක වන මම කොළඹ 07, බාන්ස් පෙදෙස, අංක 30 හි පදිංචි පෝලින් ගුණාන්ගනී ගාල්ලගේ *විවාහයට පෙර* බස්නායක යන අයට ඩී. එල්. එච්. ගන්ලත් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2003 අගෝස්තු මස 19 වැනි 22 දින වලදී ලියා සහතික කරන ලද අංක 1159 හා 1160 දරන ඇටෝර්නි බලපත්‍ර මගින් මා දී තිබුණු සියළු බලයත්, එම ඇටෝර්නි බලපත්‍රත් 2009.06.01 දින සිට මා අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

2009.06.01 වැනි දින සිට එය බල රහිත සහ නීතියෙන් වලංගු නොවන හෙයින් මින් පසු ඉහත කී ඇටෝර්නි බලපත්‍ර මගින් පෝලින් ගුණාන්ගනී ගාල්ලගේ *විවාහයට පෙර* බස්නායක යන අය කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මා වගනොකියන බවට මෙයින් ප්‍රකාශ කරමි.

පී. ඒ. බී. ජයනාත් මයිකල් බස්නායක.

07-380

---

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කෙරෙන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නාමය : ලංකා එඩියුකේෂන් ඇන්ඩ් රිසර්ච් නෙට්වර්ක්
සමාගමේ අංකය : ජී. ඒ 2269
ලියාපදංචි ලිපිනය : අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07

සමාගම් ලේකම්.

07-390

---

## මහජනතාව වෙත දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2009 මැයි මස 26 වැනි දා පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : කන්වර්ස් සොලුෂන්ස් ලිමිටඩ්
සමාගමේ අංකය : පීබී 3710
ලියාපදිංචි කාර්යාලය : අංක 104, කිතුල්වත්ත පාර, කොළඹ 08.

එස්. ජේ. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්,

04 වැනි මහල, අංක 02,
කාසල් පටුමග,
කොළඹ 04.

07-424

---

## මහජනතාව වෙත දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2009 ජුනි මස 04 වැනි දා පිහිටවූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ග්ලෝබල් ස්පෝර්ට්ස් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 67992
ලියාපදිංචි කාර්යාලය : අදියර II, රිංග් පාර, කටුනායක වෙළඳ කලාපය, කටුනායක.

එස් ජේ කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

04 වැනි මහල, අංක 02,
කාසල් පටුමග,
කොළඹ 04.

07-425

**මහජනතාව වෙත දැනුම් දීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2009 ජූනි මස 09 වැනි දා පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : නුවණැස (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 68051
ලියාපදිංචි කාර්යාලය : අංක 267, පන්නිපිටිය, පැලවත්ත, බත්තරමුල්ල.

එස්. ජේ. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට් ලිමිටඩ්),
සමාගම් ලේකම්වරුන්.

2009 ජූනි මස 18 වැනි දින,
04 වැනි මහල, අංක 02,
කාසල් පටුමග,
කොළඹ 04.

07-426

**දැන්වීමයි**

2007 අංක 07 සමාගම් ආඥාපනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2009.05.07 දින සිට ලියාපදිංචි කර ඇත.

සමාගමේ නාමය : බබිල් ඉවෙන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV67742
ලියාපදිංචි ලිපිනය : බබිල් ඉවෙන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 30/63H, ලොන්ඩන් පෙදෙස, කොළඹ 07.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 45,
බේබෑක් වීදිය,
කොළඹ 02.

07-375

---

**විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමේ කාරණය පිළිබඳවයි**

ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ගමගේ දීපානි සුධර්මා විජේසේකර මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 4201 සහ වර්ෂ 2008.11.05 වැනි දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් එහි ඇටෝර්නි අධිපතින් වන නාත්තන්ඩිය, වැලිපැන්න ගහමුල්ල, පන්නරේ, "සම්පත්", අංක 135 ලිපිනයේ පදිංචි තොටවත්තගේ චමින්ද කුමාර තොටවත්ත (ජාතික හැඳුනුම්පත් අංක 773044341 V) වන මා සහ කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස්, බ්‍රිටෝබාපුල්ලේ පෙදෙස, අංක 182 ලිපිනයේ පදිංචි සෙල්ලයියා මහේන්ද්‍රන් (ජාතික හැඳුනුම්පත් අංක 730893523 V ) වන අප දෙදෙනා විසින් ගම්පහ දිස්ත්‍රික්කයේ කිරිබත්ගොඩ, විටෝ මාවත, අංක 275/6 ලිපිනයේ පදිංචි දොන් සාලිය සම්පත් කුමාර් වෙහෙරගම (ජාතික හැඳුනුම්පත් අංක 732460756 V) යන අය ඇටෝර්නි බලකරු ලෙස පත් කර ඇති අතර එකී ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර බලරහිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමු.

07-370

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. -හෝමාගම ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී (ලියාපදිංචි අංකය පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර බලයලත් මානක, පී. එච්. පෙරේරා විසින් 1990 ජනවාරි මස 12 වැනි දින සාදන ලද අංක 1317 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තු හේවාගම් කෝරළේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, කටුවානෙවත්ත කියන ඉඩමේ ලොට් 7 දරන බෙදා වෙන් කරන ලද, පර්චස් දොළහක් (අ. 0 රූ. 0 පර්. 12) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළු දේත් සමඟ වේ.

සමරරත්න මුහන්දිරම්ගේ චන්දන සහ ආන්දුගොඩ ඇහැලප ගමගේ මොනිකා ණයකරුවන්/උකස්කරු හැටියට ද, ඔවුන් විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, 2009ක් වූ අගෝස්තු මස 18 වැනි දින පෙ. ව. 11.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.04.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* සහ ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2009.07.17 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද. 2009.07.17 වැනි දින දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම*.- හයිලෙවල් පාරේ, හෝමාගම නගර මධ්‍යයේ සිට කටුවන කිරිවත්තුඩුව පාර ඔස්සේ කි. මී. 1 1/2ක් පමණ ගොස් දකුණින් ඇති නාරන්හේන පාරට හෝ කුලසිරි කුමාරගේ මාවත ඔස්සේ මීටර් 200ක් පමණ ගොස් දකුණින් ඇති දේවාල පාරට හැරී මෙය අකරවිට මාවත ලෙස ද හැඳින්වේ. මෙම තාර අතුරන ලද පාර ඔස්සේ මීටර් 100ක් පමණ ගොස් දකුණින් ඇති අඩි 15ක් පළල ගුරුපාර හමුවේ. මෙය ඉඩමෙන් බෙදන ලද කොටසකි. මෙය මෙතනින් අවසාන වන අතර, බලාපොරොත්තු ආරක්ෂාව ද අවසාන වේ.

*ගෙවීමේ ක්‍රමය*. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (01%),

3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි. (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ හෝමාගම ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්, කොළඹ
වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය,
බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු රාජ්‍ය සහ
වාණිජ බැංකු.
දුරකථන/ෆැක්ස් අංකය : 011-2445393.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 100,
හයිලෙවල් පාර,
හෝමාගම.
දුරකථන අංක : 011-2895128-9,
011-2895126,
ෆැක්ස් අංකය : 011-2895127.

07-527

---

## මහජන බැංකුව - නිට්ටඹුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

කලගෙඩිහේන, කලටුවාව උතුර, අංක 27 හි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි පර්චස් හතලිහ (අක්. 0, රූඩ් 0, පර්. 40) ක නිවසක් සහිත වටිනා බිම් කොටස මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009.08.07 වැනි දින ප. ව. 3.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2007.10.05 වැනි දින ද, දිනමිණ, ඩේලිනිව්ස්, සහ තිනකරන් පුවත්පත්වල 2007.11.27 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - නිට්ටඹුව නගරයේ සිට නුවර - කොළඹ මාර්ගයේ තිහාරිය දක්වා පැමිණ තිහාරිය හංදියෙන් වමට ඇති වාරණ පාරේ කි. මී. 1.6ක් පමණ ගමන් කරන විට ගොඩැල්ල හන්දිය හමුවේ. ඉන් වමට හැරී මීටර් 400ක් පමණ (වතුපිටිවල පාර) යන විට දුනුඇල හන්දිය හමුවේ. ඉන් වමට හැරී මීටර් 400 ක් පමණ යන විට පාරේ වම්පසින් පාරට මායිම්ව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකාර වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 033-2222325,
ෆැක්ස් අංකය : 033-2226741,
033-2226165.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත සහ එකම ISO 9001 : 2000
සහතිකය ලත් ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ එජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර,
දුරකථන අංකය : 081-2227593, දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371,
ඊ-මේල් :schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය:*
290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408, දුරකථන/ෆැක්ස් : 011-2588176,
ඊ-මේල් : schokman@samera 1892.com
Web : www.schokmanandsamerawickreme.com.

07-452

---

## සෙලාන් බැන්ක් පී. එල්. සී. - මහනුවර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

තෙල්දෙනිය රංගල මහා මාර්ගයේ උඩවෙල ගමේ පිහිටි මැදවත්ත නමැති ඉඩමට බලයලත් මානක පී. ජේ. විජේකෝන් විසින් සාදන ලද 2007.02.25 වැනි දින අංක 363 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ ලොට් 2 ලකුණු කළ ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 35.

මෙම දේපළ තෙල්දෙනිය පදිංචි මායාකඩුව කංකානම්ගේ ඉන්දික සම්පත් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී.

වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.*-මහනුවර තෙල්දෙනිය මාර්ගයේ කි. මී. 22ක් පමණ රංගල හන්දිය දක්වා පැමිණ රංගල පාරට හැරී කි. මී. 1ක් පමණ මෙම පාරේ ගමන් ගත් විට අදාළ දේපළ පිහිටා තිබේ.

2009ක් වූ අගෝස්තු මස 18 වැනි දින ප.ව . 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.11.28 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2008.11.25 වැනි දින ඩේලිමිරර්, ලංකාදීප සහ 2008.12.19 වැනි දින වීරකේසරී පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක් ) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී සෙලාන් බෑන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නː සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බෑන්ක් පී. එල්. සී., සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක ː 011-4701284, 011-2456285, 011-2456291, 011-2456284.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුලුව, මහනුවර,
දුරකථන අංක ː 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය ː 081-2211025.

07-532

---

**සෙලාන් බැංකුව පීඑල්සී - හෝමාගම ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ (හෝමාගම ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හබරකඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 2005 ජනවාරි මස 31 වන දින අංක 4754 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත නමැති, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 3 ඒ ලකුණු කළ (බලයලත් මිනින්දෝරු පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 2001 ජනවාරි මස 10 දිනැති අංක 1852 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3 හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් එකොළහක් (අ. 0, රූ. 0, පර්. 11) විශාල ඉඩම. මෙම දේපළ හෝමාගම පදිංචි කුරුප්පු ආරච්චිගේ චමින්ද ප්‍රියදර්ශන කුරුප්පු ආරච්චි යන අය බන්ධනදායී සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ 2009 අගෝස්තු මස 07 වැනි දින පෙරවරු 10.30ට ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*- ගොඩගම හංදියේ සිට අතුරුගිරිය පාරේ කි. මී. 3 ක් පමණ දුර ගෙවා හබරකඩ හංදියට පැමිණ දකුණට ඇති රනාල පාරේ කි. මී. 1.6 ක් පමණ ගොස් දකුණට ඇති ජල්තර පාරේ මීටර් 150ක් ගිය විට අදාළ දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2008.11.28 වැනි දින පළවී ඇති අතර ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පත්වල 2008.11.22 වැනි දින පළ වී ඇත. වීරකේසරී පුවත්පතේ 2008.12.18 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුයː-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නː සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක ː 011-2456285, 2456263, 2456284

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්ස්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක ː 060-2068185, 011-2696155, 011-2572940.

07-433

---

**පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවට අයත්, රුද්‍රා මාවතේ, පාමංකඩ බටහිර, රුද්‍රා මාවත, අංක 29 දරන ස්ථානයේ පිහිටි, බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සකස් කරන ලද 1990 ජූනි මස 15 වැනි දින දරන පිඹුරුපත් අංක 2798 හි ලොට් අංක 3040 සහ 3041 ලෙස සඳහන් 'නුගගහවත්ත' ලෙස හැඳින්වෙන (129 වැනි වෙලුමේ පත් ඉරු අංක 261, වැල්ලවත්ත ලියාපදිංචි පිඹුරුපත් අංක 2 හි, ලොට් අංක 1824 හි නැවත මිනුමක් සහ කොටස් කිරීමක් වන) සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

*ඉඩමේ ප්‍රමාණයː* ලොට් 3040 - අක්. 0 රූඩ්. 0 පර්. 9.67
ලොට් 3041 - අක්. 0 රූඩ් 0 පර්. 8.67

එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියල්ල සහිතව.

*මාර්ගය සහ පිහිටීම.* - වැල්ලවත්ත මංසන්ධියේ සිට (විදුලි සංඥා මංසන්ධිය) ගාලු පාර ඔස්සේ දෙහිවල දෙසට මීටර් 250ක් වැල්ලවත්ත කොමර්ෂල් බැංකුව දක්වා පැමිණෙන්න. එහි සිට වමට එනම් රුද්‍රා මාවතට හැරී මීටර් 125ක් පැමිණිවිට මෙම දේපළට ළඟාවිය හැක. මෙය රුද්‍රා මාවතේ වම් පැත්තේ පිහිටා ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොළවත්තගේ විසින් සහතික කරන ලද සීමාසහිත ලෑන්ඩ් මාර්ක් ඉංජිනියරින් (පෞද්ගලික) ආයතනය විසින් 2006 පෙබරවාරි මස 06 වැනි දිනැති අංක 1954 දරන සහ 2006 පෙබරවාරි මස 07 වැනි දිනැති අංක 1956 දරන උකස්කරයන් ප්‍රකාර පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී ට (සීමාසහිත පැන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් හා පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ) උකස් කරන ලදුව, බැඳුම්කරු විසින් ගෙවීම් ඉටුකර නැත.

පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 අගෝස්තු මස 13 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක ) විකුණුම් බදු,
3. ගැණුම් මිළෙන් වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙක හමාරක්),
4. රු. 90,000 කට නොඅඩු සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2008 දෙසැම්බර් මස 26 වැනි දින සිලෝන් ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් ද 2008 දෙසැම්බර් මස 18 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද බලන්න.

වැඩි විස්තර ඔප්පුව සහ වෙනත් අදාල ලේඛන පරීක්ෂා කර බැලීමට සහ ලබා ගැනීමට කොළඹ 03, ගාලු පාරේ, අංක 450 සීමාසහිත පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරු - නීති අමතන්න.

දුරකථන අංක : 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත සහ එකම ISO 9001 : 2000
සහතිකය ලත් ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර
දුරකථන අංකය : 081-2227593, දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊ-මේල් :schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරයඃ*
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකථන අංකඃ011-2502680, 2585408, දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊ-මේල් : schokman@samera 1892.com
වෙබ් අඩවිය : : www.schokmanandsamerawickreme.com

07-455

**මහජන බැංකුව - ඌරගස්මන්හන්දිය ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් මෙහි පහත විස්තර වන දේපොළ, දේපොළ පිහිටි ස්ථානයේ දී 2009.08.07 වැනි දින පෙ. ව. 11.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය.*- දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, කරන්දෙණිය දකුණ මාගල ගමෙහි පිහිටි පරගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. වීරසිංහ මහතා විසින් 2006.04.06 දින මැන සාදන ලද අංක 2306 දරන පිඹුරේ නිරූපිත අංක 18125 දරන රූඩ් දෙකයි පර්චස් දහඅටක් (අ. 0, රූ. 2, පර්. 18) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2009.01.30 දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2009.03.16 දින දිනමිණ, ඩේලිනිව්ස් හා තිනකරන් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමුකරන්න.

*දේපොළට පිවිසීම.*-ගාල්ල කොළඹ පාරේ අම්බලන්ගොඩ නගරයෙහි ඇල්පිටිය මාර්ගයේ මහජ්දණ්ඩ හන්දියෙන් වමට ඇති ඌරගස්මන්හන්දිය මාර්ගයේ සැතපුම් 2 1/2ක් පමණ ගමන් කළ විට කැකිරිය ප්‍රදේශයේ අසෝකාරාමය පන්සල පසුකර දකුණට ඇති මාර්ගයේ මීටර් 200ක් පමණ ගියවිට පාරේ වම්පසට මායිම්ව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-

01. ගැණුම් මිලෙන් 10%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත ගාල්ල, පහළ ඩික්සන් පාරේ අංක 22 දරන ස්ථානයේ පිහිටි, මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 091-2232311, 2223564, 2234171 හා 2234174
ෆැක්ස් අංකය : 091-2232230

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි ඉතිරි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංක : 041-2228731, 071-4438516

07-440

### මහජන බැංකුව-දංකොටුව ශාඛාව

**1986** අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**පදිංචිය සඳහා සුදුසු වටිනා දේපළ වෙන්දේසියේ විකිණීම**

1. බස්නාහිර පළාතේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් කට්ටුව නමැති ගමේ පිහිටි පල්ලන්වේන නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා මහතා විසින් 1999.03.03 දින මැන සාදන ලද අංක 4090 දරන පිඹුරේ ලොට් අංක 53 සහ 54 දරන ඒකාබද්ධ ඉඩම සහ නවීන පන්නයෙන් යුතු නිවස.

*විශාලත්වය*ඃ අක්. 00, රූඩ් 00, පර්. 26.50.

මහජන බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය මත 2009 අගෝස්තු මස 11 වන දින පෙ. ව. 10.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2009 මැයි 22 දින *රජයේ ගැසට් පත්‍රයද*, 2009 පෙබරවාරි 16 වෙනි දින දිනමිණ, ඩේලිනිව්ස්, තිනකරන් පුවත්පත්වල වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- කොච්චිකඩේ සිට දළුවකොටුව දක්වා ගමන් කර බේස්ලයින් පාරට වමට හැරී මීටර් 900ක් පමණ ගමන් කළ පසු හමුවන පටුමග ඉදිරිපිට පාරේ දකුණු පසට මායිම්ව අංක 528 දරන දේපළ පිහිටා ඇත. මෙම දේපළ බේස්ලයින් පාර හා අතුරු පාරකට මායිම්ව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසි අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, පුත්තලම ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 032-2253301, ෆැක්ස් අංකය 032-2255247

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවවොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
වෙන්දේසිකරු, තක්සේරුකරු හා උසාවි කොමසාරිස්,

අංක 22,
ප්‍රනාන්දු පාර,
මීගමුව.
දුරකථන අංක : 031-2223219/2277518.

07- 430

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 21439 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, දොරණගොඩ ග්‍රාමයේ පිහිටි දවටගහවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු කේ. කේ. ඒ. එස්. පද්මිණී විසින් මැන සාදන ලද අංක 3663 හා 2003 පෙබරවාරි මස 09 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක ඒ ලෙස ලකුණු කළ, බෙදාවෙන් කරන ලද බිම් කට්ටිය.

*ඉඩමේ ප්‍රමාණය.*- අක්. 0 රූඩ් 0 පර්. 28 *හෙවත්* හෙක්ටයාර් 0.0708, එහි පිහිටි ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් සහතික කරන ලද, 2004 පෙබරවාරි මස 25 වැනි දිනැති අංක 21439 දරන උකස්කරය ප්‍රකාර, උඩුගම්පොළ පදිංචි කහඳව අප්පුහාමිලාගේ දිනේෂ් සංජීව කුලරත්න විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 අගෝස්තු මස 04 වැනි දින (අඟහරුවාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*- මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය ඃ-

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක ) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක්),
4. රු. 34,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක : 011-2440366/77.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත සහ එකම ISO 9001 : 2000
සහතිකය ලත් ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ එජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය ඃ*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර,
දුරකථන අංකය : 081-2227593, දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371,
ඊ-මේල් :schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරයඃ*
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකථන අංකය : 011-2502680, 2585408, දුරකථන/ෆැක්ස් : 011-2588176
ඊ-මේල් : schokman@samera 1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

07-454

### මහජන බැංකුව - මරදගහමුල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහ පත්තුවේ, උතුරු අලුත්කුරු කෝරළයේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ මීගමුව - මීරිගම පාරට ආසන්නව දූනගහ ගොඩිගමුව පාරේ පල්ලියපිටිය ගමේ කෝන්වත්ත කැලේවත්ත නමැති ඉඩම.

*ප්‍රමාණය* - ලොට් 1 - අක්කර 5,
ලොට් 2 - අක්කර 8 රූඩ් 0 පර්. 17.32,
(එක දේපළක් වශයෙන් සැලකේ)

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින්, 2009.08.07 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2004.04.08 වැනි දින ද, 2005.07.15 දින දිනමිණ ද, 2005.07.18 දින ඩේලිනිව්ස් සහ 2005.07.15 දින තිනකරන් ද වශයෙන් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - මරදගහමුල නගරයේ සිට මීගමුව මාර්ගයේ ඉදිරියට යන විට හමුවන දූනගහ මංසන්ධියෙන් දකුණට ඇති ගොඩිගමුව මාර්ගයේ කි. මී. 1.2ක් පමණ ගිය විට දකුණු පසින් දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මුඩුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකාර වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 033-2222325,
ෆැක්ස් අංකය : 033-2226741.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත සහ එකම ISO 9001 : 2000
සහතිකය ලත් ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ එජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකථන අංකය : 081-2227593, දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊ-මේල් :schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය:*
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකථන අංකය :011-2502680, 2585408, දුරකථන/ෆැක්ස් : 011-2588176,
ඊ-මේල් : schokman@samera 1892.com

Web : www.schokmanandsamerawickreme.com.

07-453

---

### මහජන බැංකුව - වත්තල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වත්තල ප්‍රාදේශීය සභාවේ හැඳල උප කාර්යාල බල සීමාව තුළ කෙරවල පිටිය ගමේ වරිපනම් අංක 187 හා 187/ඒ දරන කෝන්ගහවත්ත හෙවත් මිල්ලගහවත්ත නමැති ඉඩමේ කඩය හා නිවසක් සහිත පර්චස් හයයි දශම හයයි එකක (අ. 0 රූ. 0 පර්. 6.61) බිම් කැබැල්ල මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2009.08.03 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2002.09.19 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත්වල 2008.03.14 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- වත්තල - හැඳල හන්දියෙන් ඇලකන්ද පාරේ ගියවිට කෙරවලපිටියට යන හන්දිය දකුණුපසින් හමුවේ. එම හන්දියෙන් කෙරවලපිටිය පාරේ. කි. මී. 1ක් පමණ ගිය විට 'ආසිරි උයන' ට යන පාර වම්පසින් හමුවේ. එම පාර ආරම්භයේ කෙරවලපිටිය පාරට හා 'ආසිරි උයන' ට යන පාරට මුහුණ ලා මෙම නිවස හා කඩය සහිත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,

3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකාර වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකයඃ 033-2222325,
ෆැක්ස් අංකයඃ 033-2226741.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු.

අංක 22, ප්‍රනාන්දු මාවත,
මීගමුව.
දුරකථන අංකය ඃ 031-2223219

07/431

---

**මහජන බැංකුව - පැල්මඩුල්ල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කොරළේ මැද පත්තුවේ කිරිබත්ගල පිහිටි කෝන්ගහදොල හේන හෙවත් කෝන්ගහ දොලවත්ත නමැති ඉඩමට අවසරලත් මානක එම්. එස්. දියගම මහතා විසින් මැන සාදන ලද අංක 2204 හා 17.06.1990 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් අංක 01 දරන කොටසට මායිම්, උතුරු නැගෙනහිරටඃ ලොට් 2 ද, දකුණු නැගෙනහිරට ඃ කෝන්ගහ දොලද, දකුණු බස්නාහිරට බී. වී. නන්දසේනට අයිති කෝන්ගහදොලේ හේන ද, උතුරු බස්නාහිරටඃ කිරිබත්ගල සිට පැල්මඩුල්ල දක්වා දිවෙන පාර ද, යන මායිම්වල පිහිටි පර්චස් විසි හතරක් (අක්. 0, රූ. 0, පර්. 24) විශාල ඉඩම සහ ඊට අයිති ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සියළුම දේද වේ.

මෙම ඉඩම දැනට රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 788/59 පත්ඉරු යටතේ ලියාපදිංචි වී ඇත.

ප්‍රමාණය (අ. 0. රූඩ්. 0, පර්. 24) කි. මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2009 අගෝස්තු මස 04 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2009.03.13 වැනි දිනද, දිනමිණ, හා ඩේලිනිවුස් පුවත්පත්වල 2009.02.26 වැනි දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- පැල්මඩුල්ල නගරයේ සිට ඇඹිලිපිටිය පාරේ කිරිබත්ගල මාර්ගයේ කි. මී. 3 1/2 පමණ ගියපසු පීල්ල හන්දිය පසු කරන විට හමුවන කඳුගැටය මුදුනේ වම් පස පිහිටි නිවස හා දේපළ පාරට මායිම්ව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසන්වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය ඃ

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල දින 30 ක් ඇතුලත රත්නපුර නවනගරයේ අංක 54, මහජන බැංකුවේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුයි. දුරකථන අංක 045-2223084 045-2230818, ෆැක්ස් අංකය ඃ 045-2222711. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඒ. එස්. ලියනගේ. සා. වි.,
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ දිවුරුම්ලත් භාෂාපරිවර්තක.

අංක 228/ඒ,
වලව්වත්ත, කැස්බෑව,
දුරකථන අංක ඃ2703478, 0777-459823.

07-483

---

**ලංකා බැංකුව**

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය හා එහි සංශෝධන යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.01.23 වැනි දිනැති අංක 1586 දරන ගැසට් පත්‍රයේ හා 2009.01.15 දිනැති ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොළිය ද, ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2009.08.08 වැනි දින පෙ. ව. 11.30 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් වෙන්දේසිකාර, තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, වෝඩ් අංක 9, කොච්චිකඩේ දකුණ, පරණ යොන් වීදියෙහි පිහිටි, බලයලත් මිනින්දෝරු එෆ්. රෙයිමන්ස් විසින් සාදන ලද 1825 පෙබරවාරි මස 10 දිනැති මැනුමෙහි කලින් වරිපනම් අංක 116 (සහ 110) සහ දැනට පරණ යොන් වීදියෙහි වරිපනම් අංක 84 දරන එකී ඉඩම උතුරට : පරණයොන් වීදිය ද, නැගෙනහිරට : උදුමා ලෙබ්බේ මරික්කාර් සේකදි මරික්කාර්ට අයිති වත්තද, දකුණට : උදුමා ලෙබ්බේ මෙස්රියාට අයිති වත්ත ද, බස්නාහිරට : අබ්දුල්පුල්ලේ මීරා නතීජාට අයත් නිවෙස ද මායිම්ව ප්‍රමාණයෙන් පර්චස් පහයි සියයෙන් පහකින් ද (අ. 0 රූ. 0 පර්.5 5/100) ද සමන්විත වන අතර, ඊට අයත් සියලු දේ ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ඒ 1065/155 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු කේ. මසිලාමණී විසින් සාදන ලද අංක 262 සහ 1986 ජනවාරි මස 27 දිනැති පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කර ඇත :-

ඉහත කී කොච්චිකඩේ දකුණ, පරණ යොන් වීදියෙහි පිහිටි පරණ යොන් වීදියෙහි කලින් වරිපනම් අංක 116 සහ 110 දරණ ලද, වරිපනම් අංක 84 දරන අංක 262 දරන පිඹුරෙහි ඒ වශයෙන් දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : පරණයොන් වීදිය ද, නැගෙනහිරට : පරණ යොන් වීදියේ වරිපනම් අංක 88 දරන පරිශ්‍රය ද, දකුණට : පරණ යොන් වීදියෙහි වරිපනම් අංක 80 දරන පරිශ්‍රයද , බස්නාහිරට : පරණ යොන් වීදියෙහි වරිපනම් අංක 82 දරන පරිශ්‍රය ද, මායිම්ව ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම පහයි තුන (අ. 0 රූ. 0 පර්. 8.53) කින් සමන්විත වන අතර, එකී අංක 262 දරන පිඹුර ප්‍රකාර එහි ඇති ගහකොළ, වැවිලි ගොඩනැගිලි හා සියලු දේ ද අයත් වේ.

ඩී. කේ. එස්. මහින්ද,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
මධ්‍යම වෙළඳපොළ ශාඛාව.

07-537

---

### මහජන බැංකුව - ගාල්ල මහවීදිය ශාඛාව

1982 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් මෙහි පහත විස්තර වන දේපළ, දේපළ පිහිටි ස්ථානයේ දී 2009.08.11 දින පෙ. ව. 10.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය.-* දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර තුළ ගිංතොට කුරුඳුවත්තේ පිහිටි ඒ. ඒ. එච්. උම්මු සාපියාට අයත් වත්ත නොහොත් කනාපදිංචි වත්ත නමැති ඉඩමේ බෙදා වෙන්කළ 7-I හි 7-I-3 දරන පර්චස් හතයි දශම බින්දුවයි හතරක් (අ. 0, රූ. 0, පර්. 7.04) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2008.12.26 දින රජයේ ගැසට් පත්‍රයේ ද 2009.03.16 දින දිනමිණ, ඩේලිනිව්ස් හා තිනකරන් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.-* ගාල්ල - කොළඹ ප්‍රධාන මාර්ගයේ ගිංතොට පාලම අසලින් වැටී ඇති ගිංතොට-වක්වැල්ල පාරේ මීටර් 200ක් පමණ දුරින් ඇති තුනී ලෑලි කර්මාන්ත ශාලාව අසලින් දකුණු - පසට ඇති අබ්දුල් අසීස් මාවතේ මීටර් 250ක් පමණ ගියවිට පාරේ දකුණු පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-

01. ගැනුම් මිලෙන් 10%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත ගාල්ල, පහළ ඩික්සන් පාරේ, අංක 22 දරන ස්ථානයේ පිහිටි, මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරුට ගෙවිය යුතුය.

දුරකථන අංක : 091-2232311, 2223564, 2234171 හා 2234174
ෆැක්ස් අංකය : 091-2232230.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි ඉතිරි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.
දුරකථන අංක : 041-2228731
071-4438516.

07-438

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - ගම්පොල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පොල නගරයට ඉතා ආසන්නව රත්මල්කඩුව ගමේ පිහිටි 'සිංහපිටිය එස්ටේට්' නමැති ඉඩමට බලයලත් මානක බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් 2005.05.04 වැනි දින අංක 5937 පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ ලොට් 1 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි වගාව ඇතුලු අනෙකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 40.

මෙම දේපල සමරකෝන් පොඩිආරච්චිගේ උපාලි බන්ඩාරගේ ණයකරුවන් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.*-ගම්පොල නගරයේ සිට අම්බුළුවාව පාරේ (බෝක්කු අංක 26/1) කි. මී. 1.5ක් පමණ ගමන් කර ආරාමය පාරට හැරෙන්න. මෙම පාරේ මීටර් 900ක් පමණ ගමන් ගත් විට අදාළ දේපළ පිහිටා තිබේ.

2009ක් වූ අගෝස්තු මස 18 වැනි දින පෙ.ව . 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.06.19 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2009.05.29 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් හා තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැණුම් මිළෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු, විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිළෙන් ඉතිරි 90% (සියයට අනුවක් ) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. කළමනාකරු කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අංක 121, නුවර පාර, ගම්පොල.

දුරකථන අංක : 081-2354132-3 / 081-2354131.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුලුව,
මහනුවර.
දුරකථන අංක 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081-2211025.

07-534

---

**සම්පත් බැංකුව පී. එල්. සී**

(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ විකිණීමේ දැන්වීම

ගිණුම් අංකය : 0010 1000 8383.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.28 වැනි දිනැතිව සම්මත කර ගන්නා ලදුව 2009.06.26 දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2009.02.03 දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් යන දිනපතා පළවන පුවත්පත් වල පළ කරන ලද දැන්වීම් පරිදි කොළඹ බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම විසින් පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍ර රුපියල් මිලියන පනස් පහකුත් එක්ලක්ෂ හතලිස් හයදහස් නවසිය පනස් නවයයි ශත හැත්තෑහතරක (රු. 55,146,959.74ක් පමණයි) මුදල සමග තවත් රුපියල් මිලියන හතලිස් දෙලක්ෂ පනස් පන්දහස් හැත්තෑපහක (40,255,075ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට විස්ස (20%) බැගින් වූ පොලී මුදලක් ද, තවත් රුපියල් දොලොස් මිලියන තුන්ලක්ෂ හතලිස් තුන්දහස් හත්සිය පනහක (රු. 12,343,750ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට එකොලහක් (11%) බැගින් වූ පොලී මුදලක් ද 2008 අප්‍රේල් මස 02 වැනි දින සිට විකුණුම් දින තෙක් සම්පූර්ණ පොලී මුදල ද සමග එකී අංක 610, 659, 1205, 1207, 1135 සහ 1153 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු හිඟව ඇති සම්පූර්ණ ණය මුදල පියවා නිමවන දින තෙක් පොලී මුදල් ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා එකී ස්ථානයේදීම 2009.08.13 වැනි දින පෙ. ව. 11.00ට ආරම්භකර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

01. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, තල්අරඹ යන ගම පිහිටා ඇති 'ඉඳිගහවත්ත' නමැති ඉඩමේ ලොට් අංක ඒ දරන ඉඩම ලෙස වඩාත් මැනවින් විස්තර කොට ඇති බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. කුලරත්න විසින් මැන සාදන ලද 2003 මැයි මස 22 දින හා අංක 497 දරන පිඹුර පරිදි උතුරට : එම ඉඩමේ ලොට් 2 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 5 (අඩි අටක් පළලැති පාර) සහ එම ඉඩමේම ලොට් 4සී (අඩි හතරක් පළලැති පාර) ද, දකුණට : අංක 244 පිඹුරේ ලොට් 2 සහ ගාල්ල සිට මාතර දක්වා දිවෙන මහා මාර්ගය ද, බටහිරට : එම ඉඩමේ කොටසකින් ද මායිම් වූ පර්චස් විසිඅටයි දශම තුනක් (අ. 0, රූ. 0. පර්. 28.3) විශාලැති ඉඩම ද ඊට අයත් සියලු දේ ගොඩනැගිලි ද, අයිතිවාසිකම්, මාර්ග, වරප්‍රසාද, පරමශතා හා ප්‍රවේශ අයිතිය ද සමග වූ මාතර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත් ඉරුව ඩී 860/328හි ලියාපදිංචි කළ පිඹුරු අංක 497හි දැක්වෙන ඉඩම හා පරිශ්‍රය.

ඉහත සඳහන් වන්නේ පහත දැක්වෙන ඉඩම් කැබලි තුන ඒකාබද්ධ කොට මැන සාදන ලද ඉඩමකි.

ඉහත කී තල්අරඹ යන ගම පිහිටි 'ඉඳිගහවත්ත' යන ඉඩමේ ලොට් 4 නමැති බිම් කොටස සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. කුලරත්න විසින් නැවත මැන සාදන ලද 1999 නොවැම්බර් මස 17 දාතම හා අංක 244 දරන පිඹුරේ ලොට් 01 ලෙස වඩාත් මැනවින් විස්තර කොට ඇති උතුරට : එම ඉඩමේ ලොට් 4 බී ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 2 ද, දකුණට : ගාල්ල සිට මාතර දක්වා දිවෙන මහ මාර්ගය ද, එම ඉඩමේ කොටසක් ද මායිම් වූ පර්චස් පහලොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාලැති ඉඩම ද ඊට අයත් සියළු දේ ද ගොඩනැගිලි පරවශතා අයිතිවාසිකම් ආදිය ද සමග පිඹුරු අංක 244 දැක්වෙන මාතර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඩී 860/320හි ලියාපදිංචි වූ ඉඩම හා පරිශ්‍රය.

ඉහත කී තල්අරඹ යන ගම පිහිටි 'ඉදිගහවත්ත' යන ඉඩමේ ලොට් 4 නමැති බිම් කොටස නැවත මැන බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. කුලරත්න විසින් සාදන ලද 1999 ඔක්තෝබර් මස 26 දාතම හා අංක 241 දරන පිඹුරේ ලොට් 4බී ලෙස වඩාත් මැනවින් විස්තර කොට ඇති උතුරට : එම ඉඩමේ ලොට් 3 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 4සී (අඩි 4ක් පළලැති පාර) ද, දකුණට : අංක 244 පිඹුරේ ලොට් 1 හා 2 ද, බටහිරට : එම ඉඩමේ කොටසක් ද මායිම් වූ පර්චස් පහයි දශම හතයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 5.70) විශාලැති ඉඩම ද ඊට අයත් සියලු දේද අයිතිවාසිකම්, මාර්ග, වරප්‍රසාද, ගොඩනැගිලි හා ප්‍රවේශ අයිතිය ද සමග වූ පිඹුරු අංක 241හි දැක්වෙන හා මාතර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත් ඉරුව ඩී 1045/232හි ලියාපදිංචි වූ ඉඩම හා පරිශ්‍රය.

ඉහත කී තල්අරඹ යන ගම පිහිටි 'ඉදිගහවත්ත' යන ඉඩමේ ලොට් 3 ලෙස දැක්වෙන බලයලත් මිනින්දෝරු කේ. සිරිවර්ධන විසින් මැන සාදන ලද 1998 මාර්තු 09 දාතම හා අංක 41/1988 දරන පිඹුරේ ලොට් 3 ලෙස වඩාත් මැනවින් විස්තර කොට ඇති උතුරට : එම ඉඩමේ ලොට් 2 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 5 (අඩි අටක් පළලැති පාර) ද, දකුණට : එම ඉඩමේ ලොට් 4බී ද, බටහිරට එම ඉඩමේ කොටසක් ද මායිම් වූ රූඩ් එකයි පර්චස් හතයි දශම හයයි බින්දුවක් (අ. 0, රූ. 1, පර්. 7.60) විශාලැති ඉඩම ද ඊට අයත් සියලු දේ ද අයිතිවාසිකම්, මාර්ග, වරප්‍රසාද ගොඩනැගිලි හා ප්‍රවේශ අයිතිය ද සමග වූ පිඹුරු අංක 41/1988හි දැක්වෙන හා මාතර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඩී860/311හි ලියාපදිංචි වූ ඉඩම හා පරිශ්‍රය.

පහත සඳහන් ප්‍රවේශ අයිතීන් ද සමග වේ

ඉහත කී තල්අරඹ යන ගම පිහිටි 'ඉදිගහවත්ත' ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. සිරිවර්ධන විසින් මැන සාදන ලද 1988 මාර්තු මස 09 දාතම හා අංක 11/1988 පිඹුරේ ලොට් 05 (අඩි 8ක් පළලැති පාර) ලෙස මැනවින් විස්තර කොට ඇති උතුරට : එම ඉඩමේ ලොට් 2 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 1 ද, දකුණට : වල්ගම සිට මාතර දක්වා දිවෙන මාර්ගය ද, බටහිරට : එම ඉඩමේ ලොට් 3 හා 4 ද, මායිම් වූ පර්චස් අටයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 8.5) විශාලැති අංක 41/1988 පිඹුරේ ලොට් 5 ලෙස දැක්වෙන මාතර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඩී 860/330හි ලියාපදිංචි වූ බිම් කොටස.

ඉහත කී තල්අරඹ 'ඉදිගහවත්ත' ඉඩමේ ලොට් 4 නැවත බෙදා බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. කුලරත්න විසින් මැන සාදන ලද 1999 ඔක්තෝබර් මස 26 දාතම හා අංක 241 දරන පිඹුරේ ලොට් 4C (අඩි 4ක් පළලැති පාර) ලෙස මැනවින් විස්තර කොට ඇති උතුරට : එම ඉඩමේ ලොට් 3 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 5 (අඩි 8ක් පළලැති පාර) දකුණට : ගාල්ල සිට මාතරට දිවෙන ප්‍රධාන මාර්ගය ද, බටහිරට : එම ඉඩමේ ලොට් 4 A ද මායිම් වූ පර්චස් එකයි දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 1.9) විශාලැති අංක 241 පිඹුරේ ලොට් 4C ලෙස දැක්වෙන මාතර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඩී 1045/233හි ලියාපදිංචි වී බිම් කොටස.

අංක 610 උකස් බැඳුම්කරය යටතේ උකස් තබා ඇති :

02. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ග්‍රාවෙට්ස් හතරේ සහ මහ නගර සභා සීමාව තුළ පඩුරන යන ගම පිහිටි (පැරණි අංක 376 දරන) අනගාරික ධර්මපාල මාවතේ අංක 382 හා 384 අංක දරන ස්ථානයේ පිහිටි ගොඩ කඳුරුගහ හෙවත් මහකොරටුව නැතහොත් ගොඩ කදුරුගහ වත්ත හෙවත් මහකොරටුව නමැති ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු පී. එම්. අබේගුණවර්ධන විසින් මැන සාදන ලද 2004 අගෝස්තු මස 31 දාතම හා අංක 239 දරන පිඹුරේ ලොට් 1 ලෙස දැක්වෙන බිම් කොටස රාලහාමිවත්ත ලොට් 6ඩී, 6ඊ, 6එෆ් ලෙස දැක්වෙන කොටස ඒකාබද්ධ කොට ද, රාලහාමිගේවත්ත ලොට් බී ලොට් 4 හෝ ලොට් බී ද, රාලහාමිගේ වත්ත ලොට් බී වෙතින් ලොට් 5 ද, රාලහාමිගේ වත්ත ලොට් ඒ ද, බෝගහවත්තෙන් කොටසක් ද ගොඩකඳුරුගහ පිට්ටනිය හෙවත් මහකොරටුව (ගොඩකඳුරුගහ පිට්ටනිය හෙවත් මහ කොරටුව) ලොට් A ලොට් බී ද යන බිම් කොටස් සියල්ල ඒකාබද්ධ කරන ලද ලෙට් 1 නම් වූ බිම් කොටස, උතුරට : ඉඩමේ ලොට් 5 ද, නැගෙනහිරට : මහනගර සභා පාර ද, දකුණට : ලොට් 6 ඒ, 6බී, 6සී ද, බටහිරට : රාලහාමිගේවත්ත ද මායිම් වූ පර්චස් විසිදෙකයි දශම අටක් (අ. 0, රූ. 0. පර්. 22.8) විශාලැති ඉහත කි අංක 239 පිඹුරේ දැක්වෙන හා මාතර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඒ 469/207හි ලියාපදිංචි වී ඇති බිම් කොටස.

අංක 659, 1135 හා 1207 උකස් බැඳුම්කර තුන යටතේ උකස් තබා ඇති.-

3. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ග්‍රැවට්ස් හතර හා නගර සභා සිමාව තුළ වල්ගම යන ගම පිහිටි අනගාරික ධර්මපාල මාවතේ අංක 14(1) දරන අත්තලෙහි වත්ත හෙවත් ගෙදරවත්ත ලොට් ඒ න් ලොට් 4 ලෙස වඩාත් මැනවින් විස්තර කොට ඇති බලයලත් මිනින්දෝරු එම්. ජේ. සමරපාල විසන් සාදන ලද අංක 899 හා 1997 අගෝස්තු මස 20 දිනැති පිඹුරේ ලොට් 4ඒ සහ 4බී යන කොටස් ඒකාබද්ධ කොට බලයලත් මිනන්දෝරු පී. එම්. අබේගුණවර්ධන විසින් සාදන ලද 2006 ඔක්තෝබර් මස 26 දාතම හා අංක 346 දරන පිඹුරේ ලොට් අංක 1, උතුරට : ගාල්ල සිට මාතර දක්වා දිවෙන පාර ද, නැගෙනහිරට : අංක 899 පිඹුරේ ලොට් බී (නිවාසවලට යන පාර) ද, දකුණට : අංක 899 පිඹුරේ ලොට් සී ද, බටහිරට : එම ඉඩමේ ලොට් 1, 2, 3 මායිම් වූ පර්චස් දහයයි දශම නවයයි පහක් (අ. 0, රූ. 0, පර්. 10.95) විශාලැති ඉඩමට ඊට අයත් සියළු දේද ගහකොළ ගොඩනැගිලි ප්‍රවේශ මාර්ග අයිතිවාසිකම් පරමශතා ඇතුළු සියලු දේද සමග වූ අංක 346 පිඹුරේ ලොට් 1 ලෙස දැක්වෙන ඉඩම.

ලොට් 1 බිම් කොටස පහත මැනවින් විස්තර කොට ඇති පරිදි ලොට් 4ඒ හා 4බී ඒකාබද්ධ කොට නැවත මැන සාදන ලදී.

ඉහත කී අත්තලෙහිවත්ත හෙවත් ගෙදරවත්ත ලොට් ඒ න් ලොට් 4 ලෙස දැක්වෙන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එම්. ජේ. සමරපාල විසින් මැන සාදන ලද 1997 අගෝස්තු මස 20 දාතම හා අංක 899 දරන පිඹුරේ ලොට් 4ඒ ලෙස දැක්වෙන උතුරට : ගාල්ල සිට මාතර දක්වා ප්‍රධාන පාර ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් බී (අඩි 15ක් පළලැති පාර) ද, දකුණට : අත්තලෙයිවත්ත හෙවත් ගෙදරවත්ත ලොට් 4 සී ද, බටහිරට : අත්තලෙහිවත්ත හෙවත් ගෙදරවත්ත ලෙට් 4බී හි ලොට් ඒ හි ලොට් 2 හා 3 ද මායිම් වූ පර්චස් දහයයි දශම හයයි තුනයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 10.630) විශාලැති ඉහත කී අංක 899 පිඹුරේ හා මාතර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඒ 499/199හි ලියාපදිංචි වූ බිම් කොටස හා ඊට අයත් සියළු දේ ද ගහකොළ, ගොඩනැගිලි ප්‍රවේශ මාර්ග පරවශතා ඇතුළු සියලු දේද වේ.

ඉහත කී වල්ගම පිහිටි අත්තලෙයිවත්ත හෙවත් ගෙදරවත්ත යන ඉඩමේ ලොට් ඒ එන් ලොට් 4 ලෙස බලයලත් මිනින්දෝරු එච්. ජේ. සමරපාල විසින් මැන සාදන ලද 1997 අගෝස්තු මස 20 වැනි දාතම හා අංක 899 දරන පිඹුරේ ලොට් 4බී ලෙස දැක්වෙන බෙදා වෙන් කල බිම් කොටස උතුරට : එම ඉඩමේ ලොට් 2 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 4ඒ ද, දකුණට : අත්තලෙයිවත්ත හෙවත් ගෙදරවත්ත ලොට් ඒ න් ලොට් 1 ද මායිම් වූ පර්චස් එකක් (අ. 0, රූ. 0, පර්. 1) විශාලැති අංක 899 පිඹුරේ දැක්වෙන හා මාතර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඒ 499/200හි ලියාපදිංචි බිම් කොටස ඊට අයත් සියලු දේද සමග වේ.

ඉහත කී අංක 1205 දරන උකස් බැඳුම්කරය යටතේ උකස් තබා ඇත.

4. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර මහ නගර සභා බල ප්‍රදේශයේ ග්‍රැවට්ස් හතර සීමාවේ පිහිටි හිත්තැටිය යන ගම පිහිටි මීරා පාරේ අංක 83 දරන "කහම්පලේ කුරුඳුවත්ත හෙවත් ඉසදීන් ටවුම" නම් වූ ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු බී. අත්තනායක විසින් මැන සාදන ලද 1987 මාර්තු මස 22 දාතම හා අංක 1000 දරන පිඹුර ප්‍රකාරව ලොට් 20 නැවත මැන බලයලත් මිනින්දෝරු පී. එම්. අබේගුණවර්ධණ විසින් 2004

අප්‍රේල් මස 04 දාතම හා අංක 280 පිඹුරේ ලොට් 1, උතුරට : මීරා පාර ද, නැගෙනහිරට : අංක 1230 දරන පිඹුරේ ලොට් 18 (තක්සේරු අංක 79) ද, දකුණට : පාරක් සඳහා වෙන් කළ බිම (අඩි 10ක් පළලට) ද, බටහිරට : අංක 1230 (තක්සේරු අංක 87) පිඹුරේ ලොට් 22 ද මායිම් වූ රූඩ් එකයි පර්චස් අටක් (අ. 0, රූ. 1, පර්. 8) විශාලැති අංක 280 පිඹුරේ දැක්වෙන හා මාතර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඒ 467/50හි ලියාපදිංචි වූ ඉඩම හා ඊට අයත් සියලු දේ.

අංක 1153 දරන උකස් බැඳුම්කරය යටතේ උකස් තබා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-555

හිමකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අංක 36, බුද්ධ ජයන්ති මාවත, නුවරඑළිය.

දුරකථන අංක :052-2223761/2223763.

අයි. ඩබ්ලිව්. ජයසූරිය
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක :081-2211025 071-4755974 ෆැක්ස් අංකය : 081-2211025

07-533

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - නුවරඑළිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ, මහර දළුපිටිය ගමේ පිහිටි සියඹලාගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. පී. ගුණතිලක විසින් සාදන ලද 2007.04.04 වැනි දින අංක 5437 පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ ලොට් 2 ඒ දරන ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි අනෙකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 46.5 මෙම දේපල, වීරසේකර මුදියන්සේලාගේ ඉන්දික තුෂාර ණයකරු වශයෙන්, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම*.- කොළඹ මහනුවර මහාමාර්ගයේ මහර හන්දිය දක්වා පැමිණ වම් දෙසට හැරී දළුපිටිය පාරට පිවිස කි. මී. 1.6 ක් පමන මිහිඳු මාවත දක්වා ගමන් ගන්න. පසුව වමට හැරී මීටර් 30 ක් පමණ ගිය විට අදාළ දේපල වම් දෙසින් පිහිටා තිබේ.(පුරාණ ජයසුමනාරාමය පන්සලට ඉතා නුදුරුව) 2009 ක් වූ අගෝස්තු මස 17 වැනි දින පෙ.ව. 10.00ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.06.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2009.05.26 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් හා තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ගෙවා නිම කළ යුතු වේ.

---

**පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 අගෝස්තු මස 04 වැනි දින පෙ.ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ දොරනගොඩ ගමෙහි පිහිටි (බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 691 සහ 1995.02.23 දිනැති සැලැස්මේ ලොට් 4 සහ බලයලත් මානක කේ. කේ. ඒ. එස්. පද්මිණි විසින් මැන සාදන ලද අංක 4648 සහ 2004.11.15 දිනැති සැලැස්මේ ලොට් ඒ දරන බිම් කොටස් දෙක ඒකාබද්ධ කරන ලද) කොස්ගහලන්ද හෙවත් දෙල්ගහවත්ත සහ කොස්ගහවත්තේ කැබැල්ල නමැති ඉඩමට බලයලත් මානක ජේ. පී. එන්. ජයසූරිය විසින් මැන සාදන ලද අංක 5072 සහ 2005.05.25 දිනැති සැලැස්මේ ලොට් 1 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ පලතුරු වැව්ලි ආදී සියලු දේ වේ. ප්‍රමාණය (අ. 0, රූ. 1, පර්. 9.6)

2. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ දොරනගොඩ ගමෙහි පිහිට කොස්ගහලන්ද හෙවත් දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 691 සහ 1995.02.23 දිනැති සැලැස්මේ ලොට් 5 වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ පලතුරු වැව්ලි ආදී සියලු දේ වේ. ප්‍රමාණය (අ. 0, රූ. 0, පර්. 15.50)

3. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ දොරනගොඩ ගමෙහි පිහිටි කොස්ගහලන්ද හෙවත් දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 691 සහ 1995.02.23 දිනැති සැලැස්මේ ලොට් 6 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉඩම සහ එහි තුළ පිහිටි ගහ කොළ පලතුරු වැව්ලි ආදී සියලු දේ වේ. ප්‍රමාණය (අ. 0, රූ. 0, පර්. 15.06)

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්.කේ.එන්. පී. විතාන විසින් සහතික කරන ලද අංක 6995 සහ 2005.08.06 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම ගම්ලත් රාළලාගේ නිමලසේන විසින් පැහැර හැර ඇති හෙයින් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.07.09 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ 2009.07.10 වැනි දින ගැසට් පත්‍ර බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* ගම්පහ සිට මිනුවන්ගොඩ පාර දිගේ කිලෝමීටර් 04 ක් පමණ ගොස් උඩුගම්පොල හන්දියෙන් දකුණට හැරී නයිවල පාර දිගේ කිලෝ මීටර් 02 ක් පමණ ගිය විට 2 වන කිලෝ මීටර් කණුව ඉදිරිපිට විකිණීමට නියමිත ඉඩම හමුවෙයි.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැනුම් මිලෙන් පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු සහ අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු - නීති, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී ප්‍රධාන කාර්යාලය අංක 450, ගාලු පාර, කොළඹ 03.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංකය : 2873656, 0777-672082 ෆැක්ස් අංකය: 2871184

07-568

---

## නිවැරදි කිරීමයි

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී

2009.07.10 වැනි දින අංක 1610 දරන ගැසට් පත්‍රයේ පළ වූ කොළඹ දිස්ත්‍රික්කයේ බොරලැස්ගමුව ගමේ අබේරත්න මාවතේ වරිපනම් අංක 61/46/0 දරන හින්න ඕවිට නමැති ඉඩමට අදාළ වෙන්දේසි කිරීමේ නිවේදනයේ 4 වැනි ජේදය පහත සඳහන් අයුරින් නිවැරදි විය යුතුය.

'යෝජනා සම්මුති පිළිබඳ නිවේදනය සඳහා 2009.07.03 වැනි දින ගැසට් පත්‍රය සහ 2009.07.06 දින ඩේලි නිවුස් හා ලක්බිම පුවත් පත් ද 2009.07.04 දින සුඩර් ඔලි පුවත්පත් ද බලන්න'.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.

07-664

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.